# අතීත නර්තනයේ රංග වස්ත්‍රාභරණ පුරාවිද්‍යා ඇසින්

එච්.එස්. මෝදරගේ [31]

---

ලෝකයේ විවිධ රටවල සංස්කෘතීන් අතරින් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය ප්‍රමුඛස්ථානයක් ලබා ගන්නා බව දැකිය හැකි අතර එකී සංස්කෘතිය අතීතයේ සිට ම මෙ රට පැවති බවට මූලාශ්‍ර සාධක මගින් විද්‍යමාන වේ. කලාව සෞන්දර්යය ඉතා ඈත අතීතයේ සිට ම  මෙ රට පැවති බවට අපට හමුවන මූලාශ්‍ර තුළින් දැකගත හැකි ය. මේ ලිපිය තුළින් බලාපොරොත්තුවන්නේ මෙම නර්තන කලාව හා බැඳි රංග වස්ත්‍ර හා ආභරණ, පැරණි කැටයම් සිතුවම් හා මූර්ති මඟින් නිරූපණය වන ආකාරය විමසා බැලීම ය. අතීතයේ සිටම නර්තන කලාව පැවති බවට දැක්වෙන මූලාශ්‍ර සාහිත්‍ය මෙන් ම පුරාවිද්‍යාත්මක අංශ ද්විත්වය තුළින් ම හමුවේ. සාහිත්‍ය මූලාශ්‍රය වල නර්තනය සඳහා යොදාගනු ලැබූ රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව ඉදිරිපත් කර ඇත. මහාවංසය වැනි වංසකතාවන්හි මෙන් ම සංදේශ, විදේශිකයන්ගේ වාර්තා වැනි මේ සියලු ම තැන්හි දී රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව කරුණු ඉදිරිපත් කර ඇත. මෙම සාහිත්‍ය මූලාශ්‍රය වල ඇති රංග වස්ත්‍රාභරණ වර්තමානයට ගැලපිය නොහැකි වන්නේ මේවා දෘශ්‍ය මූලාශ්‍ර නොවන බැවිනි. නමුත් මෙම සාහිත්‍ය තොරතුරු මඟින් ද යම්තාක් දුරට අපට රංගනයට යොදා ගත් වස්ත්‍ර හා ආභරණ පිළිබඳ ව විමසා බැලිය හැකි ය. ලංකාවේ හමුවන කැටයම් අතරින් අනුරාධපුර, පොළොන්නරු වැනි යුග ගණනාවක් ඔස්සේ මෙම නර්තන කලාව පැවති බව හඳුනා ගත හැකි ය. මෙහි දී හමුවන ශෛලමය කැටයම්, ලෝහමය කැටයම් මෙන් ම මහනුවර යුගය වනවිට දක්නට ලැබෙන දාරුමය කැටයම් ද නර්තන කලාව සඳහා යොදාගනු ලැබූ රංග වස්ත්‍රාභරණ තුළින් දේශීය ඌරුවක් මෙන් ම  විදේශීය ඌරුවක් ගත් බව දෘශ්‍ය මූලාශ්‍ර අධ්‍යනය කිරීම තුළින් හඳුනාගත හැකි ය. නිදසුනක් ලෙස පොළොන්නරුවේ අංක 2 දරණ ශිව දේවාලයෙන් ලැබුණ ලෝකඩ ප්‍රතිමාව එම වස්ත්‍ර මැනවින් නිරූපණය කරන මූලාශ්‍රයක් ලෙස පෙන්වාදිය හැකි ය. මෙහි රංග වස්ත්‍රාභරණ ඉන්දියාවේ සාම්ප්‍රදායික භරත නාට්‍යම් හි යොදා ගනු ලබන රංග වස්ත්‍රාභරණයන්ට සමානකමක් දක්වන බවක් පෙනේ. නර්තනය සඳහා කාන්තාවන් මෙන් ම පිරිමි පාර්ශවය ද එක්වී ඇති අයුරු මූලාශ්‍රය තුල විස්තර වේ. එහි දී ඔවුන්ගේ ඇඳුම් පැළැඳුම් වෙනස් විය. එමෙන් ම නර්තකයන් හා වාදකයන් ද ලෙස දෙපිරිසක් විය. ඔවුන්ගේ ද ඇඳුම් ආයිත්තම් වෙනස් රූපයකින් දැකගත හැකි ය. රංගනයට යොදාගත් වස්ත්‍රයේ සිට අලංකරණයට යොදා ගත් ආභරණ විවිධාකාරයෙන් වර්ගීකරණය වන අයුරු වර්තමානයේ නර්තනයට යොදා ගන්නා සාම්ප්‍රදායික ඇඳුම් පැළඳුම්වලට මෙම ඇඳුම් පැළඳුම් සමවන ආකාරය මෙම අධ්‍යයනය තුළින් පෙන්වා දී ඇත. මේ තුළින් එවකට මෙම නර්තන ශිල්පීන්ට සමාජයේ ලැබුණ ස්ථානය හා නර්තන කලාවේ දියුණුව පිළිබඳ ව  විමසිය හැකි ය. මෙම අතීත රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව එතරම් සැළකිය යුතු අධ්‍යයනයක් සිදුකර නොමැති බැවින්  මේ සඳහා මූලාශ්‍ර ලිපි ලේඛන ද අල්ප බව සඳහන් කළ යුතු ය.

ප්‍රමුඛ පදඃ මූලාශ්‍ර, නර්තනය, රංග වස්ත්‍රාභරණ

---

[31] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.